ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

## ඒරෝ ඉන්ඩියා 2023 ගුවන් ප්‍රදර්ශනය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා අතින් විවෘත කෙරේ

ආසියාවේ විශාලතම ගුවන් දැක්ම සහ ප්‍රදර්ශනය වන ඒරෝ ඉන්ඩියා 2023 ප්‍රදර්ශනය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා අතින් 2023 පෙබරවාරි 13 වන දින බෙංගලාරු හිදී විවෘත විය. මෙවර මෙම ප්‍රදර්ශනය පැවැත්වෙන්නේ 14 වන වරට වන අතර එය 2023 පෙබරවාරි 13-17 දිනයන් හිදී පැවැත්වෙනු ඇත. මෙම ප්‍රදර්ශනය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 'Make in India, Make for the World' යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සහ ආරක්ෂක ක්ෂේත්‍රය තුළ ස්වයං යැපීම තහවුරු කිරීම සඳහා ආරක්ෂක කර්මාන්තය තුළ ගුවන් අවකාශයේ වර්ධනය වන ඉන්දියානු ශක්තිය ලොව හමුවේ ප්‍රදර්ශනය කරනු ඇත. ගුවන් දැක්ම ඉන්දියාවේ සහ විදේශ රටවල් රැසක අති නවීන ගුවන් යානා ප්‍රදර්ශනය කරනු ඇත.

2. ආරක්ෂක අමාත්‍ය රාජ්නාත් සිං මහතා ගුවන් දැක්මට සමගාමීව 2023 පෙබරවාරි 14 වන දින ආරක්ෂක ක්ෂේත්‍රයේ වඩා ශක්තිමත් අන්තර්ක්‍රියා තුළින් පොදු සෞභාග්‍යය (Shared Prosperity through Enhanced Engagements in Defence - SPEED) යන මැයෙන් ආරක්ෂක අමාත්‍යවරුන්ගේ පර්ෂදය පැවැත්වූ අතර ඒ සඳහා ඒරෝ ඉන්ඩියා 2023 සඳහා සහභාගී වන මිත්‍රශීලී රටවල ආරක්ෂක අමාත්‍යවරු සහභාගී වූහ.

3. ශ්‍රී ලංකාවේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා ඒරෝ ඉන්ඩියා 2023 ප්‍රදර්ශනයට සහ SPEED ආරක්ෂක අමාත්‍යවරුන්ගේ හමුවට සහභාගී විය. වඩා ශක්තිමත් සහයෝගයක් ඇති කරගත හැකි ආකාර හඳුනාගැනීම සඳහා ව්‍යාපාරික නියෝජිත පිරිසක් ද අමාත්‍යවරයා සමඟ මෙම ප්‍රදර්ශනයට සහභාගී විය. මෙම "ආසියානු සියවස" තුළ අපගේ භූ ගෝලීය මායිම් වලින් ඔබ්බට අවධානය යොමු කරමින් තිරසාර සංවර්ධනය උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සහ කර්මාන්තය සඳහා ආයෝජන ඉහළ නංවන අතර බද්ධ ව්‍යාපාර, සහ-සංවර්ධනය සහ නිෂ්පාදනය හරහා ඒරෝ ඉන්ඩියා වැනි වේදිකාවන් තුළින් ආරක්ෂක සහයෝගීතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය

මෙම අවස්ථාවේ අදහස් දක්වමින් අමාත්‍යතුමා පෙන්වා දුන්නේය. ඉන්දියානු සාගර කලාපයේ පොදු ආරක්ෂක අභියෝගයන්ට මුහුණ දීමේ දී කොළඹ ආරක්ෂක පර්ෂදය වැනි බහුපාර්ශවීය ප්‍රයත්නයන් හරහා ගන්නා සමූහ ප්‍රතිචාරයන් හි වැදගත්කම ද අමාත්‍යතුමා අවධාරණය කළේය. මෙම සංචාරය අතරතුර එතුමා ආරක්ෂක අමාත්‍ය රාජ්නාත් සිං මහතාට අමතරව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීතුමා සහ ත්‍රිවිධ හමුදාපතිවරුන් ද හමු විය.

4. ශ්‍රී ලංකා හමුදාවන් විසින් ඉන්ද්‍රා රේඩාර්, ගැඹුරු මුහුද නිරීක්ෂණ යාත්‍රා සහ හමුදා පුහුණු සිමියුලේටර වැනි ඉන්දියානු ආරක්ෂක උපකරණ රැසක් සාර්ථකව මෙහෙයවනු ලැබේ. ඉන්දියාවේ 'අසල්වැසියා ප්‍රථමයෙන්' සහ කලාපයේ සැමට වර්ධනය සහ ආරක්ෂාව (Security and Growth for All in the Region - SAGAR) යන ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකා හමුදාවන්ගේ ධාරිතා සංවර්ධනය සහතික කරමින් ඉන්දියාව විසින් පාවෙන තටාකයක්, සමුද්‍රීය මුදවාගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් සහ ඩෝනියර් ගුවන් යානයක් ලබා දීමට මෑත කාලයේදී එකඟ වී ඇත.

***

***කොළඹ***
***2023 පෙබරවාරි 16***